# 7 ශ්‍රේණිය - සිංහල

## 13 පාඩම - වාක්‍ය රචනය

## රචනා සැකිල්ලක් සැකසීම හා රචනා නිර්මාණය

- ❖ රචනාවක සැකිල්ල යටතේ දී ඇති මාතෘකාව තමා තේරුම් ගෙන හැඳින්වීම, ප්‍රවේශය, විෂය කරුණු , සමාලෝචනය හෙවත් අවසානය යන කරුණු එම රචනාවේ ගොඩ නගා ඇති අයුරු වටහා ගන්න.
- ❖ රචනාව යනු ශිෂ්‍යයාගේ ප්‍රතිබිම්බයකි.
  - එයින් ශිෂ්‍යයාගේ භාෂා භාවිතයේ හැකියාව (ව්‍යාකරණ හා සාම්ප්‍රදායික යෙදුම්)
  - ප්‍රස්තාව පිරුළු/ආප්තෝපදේස/රූඪී/ප්‍රසිද්ධ වියත් කියමන් හා උපුටන අවස්ථානුකූල ව යොදා ගැනීම
  - බාහිර පොත පත කියවා තිබීම
  - දෛනික ව පුවත්පත් කියවීම/සඟරා කියවීම/ප්‍රවෘත්තිවලට සවන්දීම
  - නිර්මාණාත්මක හැකියාව
  - රුචි අරුචිකම්
  - යමක් දෙස බලන විදිය (දෘෂ්ටිකෝණය)
  - තර්කානුකූල බව හා විස්වසනීය බව
  - අදහස් ඉදිරිපත් කරන ශෛලිය

ආදී ලක්‍ෂණ ඔස්සේ මැන බැලේ. සාර්ථක රචනාවක මෙම ලක්‍ෂණ හැකිතාක් අතුළත් කළ යුතු යි.

මාතෘකානුකූල ව රචනා ලිවීමේ දී, අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කිරීම සහ තර්කානුකූල ව ඉදිරිපත් කළ යුතු ය.

- ❖ රචනාවක් නිර්මාණය කිරීමේ දී ශිල්පීය දක්‍ෂතා ද සැලකිල්ලට ගත යුතු ය.
  - උත්තාඛ්‍යාත පද සම්බන්ධය
  - පැහැදිලි නිවැරදි අත් අකුරු
  - විරාම ලක්‍ෂණ
  - පද බෙදීම
  - අක්‍ෂර වින්‍යාසය යන කරුණුයි.
- ❖ රචනා වර්ග අනුව ඊට ගැළපෙන පරිදි ලිවිය යුතු ය.
  - විශ්ලේෂණාත්මක රචනා -(- පොදු දේපළ සුරකිමු.)
  - විචාරාත්මක රචනා (-ජංගම දුරකතන භාවිතය)
  - ප්‍රබන්ධාත්මක රචනා (මම වනයක අතරමං වීමි)

01) .පෙළ පොතේ හැඳින්වීම කියවා වාක්‍ය රචනයක ලක්ෂණ මොනවා දැයි ලියන්න.

02) . පෙළ පොතේ දී ඇති වාක්‍ය රචනාව හොඳින් කියවන්න.

03). “වැසි දිනයක්” යටතේ දී ඇති කරුණු කියවා රචනා ආකෘතියක් සකසා ආකෘතියට අනුව රචනාවක් ලියන්න.

04). “පොදු දේපළ සුරකිමු” යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.

05). “ගඟක් කතා කරයි ” මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.

06). ලිඛිත අභ්‍යාස සිදුකරන්න.